# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2017/2 – 2017 මැයි මස 02 වැනි අඟහරුවාදා – 2017.05.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

### ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ වූ නියමය

1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ (4) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනි එම්මානුවෙල් අමරතුංග වන මම මේ නියමය මගින්,

(අ) 1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට පවරාදී ඇත්තාවූ ද, මේ නියමයේ පළමුවන උපලේඛනයේ සවිස්තර ලෙස දක්වා ඇත්තාවූ ද, හෙයාර්පාක් වත්ත යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩම හා සම්බන්ධ 1982 මැයි මස 31 වැනි දින අංක 195/6 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ (1) වැනි වගන්තිය යටතේ කරන ලද නියමයේ මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිත ව දක්වා ඇති හෙයාර්පාක් වත්ත (දෙහිගොල්ල කොටස) නැමැති ඉඩමේ බිම් ප්‍රමාණයට අදාළ වන්නා වූ කොටස, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත පවරනු ලැබීම සඳහා වූ ප්‍රතිෂ්ඨාවට අදාළ නියමය හෝ කොන්දේසි අනුව ක්‍රියාකර නොමැතිවීමේ පදනම මත, ප්‍රත්‍යාදිෂ්ට කිරීම මගින් ඒ නියමය සංශෝධනය කරමි; සහ

(ආ) මේ ප්‍රත්‍යාදිෂ්ට කිරීම මත මේ නියමයේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඉඩම් ප්‍රමාණය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නැවත පැවරෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

ජෝන් ඇන්තනි එම්මානුවෙල් අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

2017 අප්‍රේල් මස 05 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'',
1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

1A – G 25493 – 17 (05/2017)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## පළමුවන උපලේඛනය

*ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත පවරා ඇති හෙයාර්පාක් වත්ත නම් ඉඩමේ විස්තරය*

| අති විශෙෂ ගැසට් පත්‍රයේ අංකය සහ දිනය | වතු ඉඩමේ නම | පරිපාලන දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත පවරන ලද ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් වලින් |
|---|---|---|---|---|
| අංක 195/6 1982.05.31 | හෙයාර්පාක් වත්ත | මහනුවර | උඩුදුම්බර | 175.27 |

## දෙවන උපලේඛනය

*ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නැවත පැවරෙන ඉඩම් කොටසෙහි විස්තර.*

| විශේෂ්‍ය අංකය | ඉඩමේ නම | පරිපාලන දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිළධාරී කොට්ඨාසය | කොමිෂන් සභාවට පැවරෙන ලද ඉඩම් ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| මහ/5 | හෙයාර්පාක් වත්ත (දෙහිගොල්ල කොටස) | මහනුවර | උඩුදුම්බර | ගැරඩිගල(879) | මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ ගන්දෙක කෝරළේ, උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිගොල්ල තැන්න ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. කුමාරි විජේකෝන් මහත්මිය විසින් 2016 පෙබරවාරි මස 16 වැනි දින මැන සකස් කර ඇති අංක 2016/20 දරන පිඹුරේ කැබලි අංක 01 යටතේ පෙන්නුම් කර ඇති අක්කර 02 රූඩ් 0 පර්චස් 00 (හෙක්ටයාර් 0.8094) ක් වන උතුරට - හෙයාර්පාක් වත්ත (මෙම ඉඩමේ ඉතිරි කොටස) ද, නැගෙනහිරට - හෙයාර්පාක් වත්ත (මෙම ඉඩමේ ඉතිරි කොටස) ද, දකුණට - හෙයාර්පාක් වත්ත (මෙම ඉඩමේ ඉතිරි කොටස) සහ පාර ද, බස්නාහිරට - පාර සහ හෙයාර්පාක් වත්ත (මෙම ඉඩමේ ඉතිරි කොටස) යන මායිම් තුළ පිහිටි හෙයාර්පාක් වත්ත (දෙහිගොල්ල කොටස) නැමති ඉඩම් කොටස. |



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.